40 වන වර්ෂය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

උපකුලපති තනතුර

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 34 (1) වගන්තිය සහ ඉන් පසුව කරන ලද සංශෝධන ප්‍රකාරව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් විශ්වවිද්‍යාලය සළුමනාකරණය කර මෙහෙයවීම සඳහා සුදුසුකම් ලත් පළපුරුදු පුද්ගලයින්ගෙන් උපකුලපති තනතුර සඳහා අයදුම්පත් හෝ නාමයෝජනා කැඳවනු ලැබේ.

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අනුව උපකුලපති විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධාරියෙකු වන අතර ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන ගිණුම් නිලධාරී සහ ප්‍රධාන අධ්‍යයන නිලධාරිද වේ. ඔහු/අය නිල බලයෙන් විශ්වවිද්‍යාල පාලක සභාවේ සහ සභාවරන සභාවේ සාමාජිකයෙකු වන අතර ඒ දෙකෙහිම සභාපතිවරයාද වේ.

1978 අංක 16 දරණ සංශෝධිත විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අනුව උපකුලපතිධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ කාලීන ධූරය අත්හරින හියහොත් හෝ හැර වසර තුනක කාලයක් සඳහා පත් කරනු ලබන අතර ඔහු/අය වයස අවුරුදු 65 සම්පූර්ණ වනතෙක් හෝ තනතුරේ කාලය අවසන් වනතුරු හෝ යන දෙකෙන් පූර්වයෙන් එළඹෙන දිනය තෙක් සේවය කළයුතු වේ.

අධ්‍යයන කටයුතු මෙහෙයවීම, විධිමත් සළුමනාකරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම, හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම මෙන්ම විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන්ද උපකුලපතිවරයා වගකිව යුතු වේ. උපකුලපතිවරයා විසින් විශ්වවිද්‍යාලයේ කටයුතු සළුමනාකරණය කිරීමේදී පාරදෘශ්‍යභාවය හා මූල්‍ය වගකීම පවත්වාගත යුතු වේ. උපකුලපතිවරයා විසින් පාලක සභා තීරණ ක්‍රියාත්මක කිරීම, විශ්වවිද්‍යාලය තුළ සහ එහි සාමාන්‍ය පරිපාලන කටයුතුවලදී විනය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වගකිව යුතු වේ.

උපකුලපතිවරයා අධ්‍යයන විෂිෂ්ටත්වය පවත්වා ගැනීමට කැපවිය යුතු අතර ශිෂ්‍යයින්ගේ සහ කාර්ය මණ්ඩලයේ අවශ්‍යතා පිළිබඳ ඔහු අවබෝධයක් තිබිය යුතු වේ. අයදුම්කරු කැපී පෙනෙන ජයග්‍රහණ, විශිෂ්ට සන්නිවේදන කුසලතා සහිත උසස් දක්ෂතා ඇති පුද්ගලයෙකු විය යුතු අතර ශිෂ්‍යයින්ගේ සහ කාර්ය මණ්ඩලයේ විවිධ අවශ්‍යතාවයන්ට ගැළපෙන අයුරින් කටයුතු කිරීමේ හැකියාව තිබිය යුතුය. ප්‍රජාව කෙරෙහි ඇති කැපවීම ඇතුළුව විශ්වවිද්‍යාලයේ මෙහෙවර පිළිබඳ ඇති අවබෝධය අයදුම්කරු/ නාමිකයා විසින් ප්‍රදර්ශනය කළ යුතුය. (විස්තර සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවිය වන www.ou.ac.lk වෙත පිවිසෙන ලෙස අපේක්ෂිත අයදුම්කරුවන්ට ආරාධනා කරනු ලැබේ.)

උපකුලපති විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල වැටුප් පරිමාණයේ ඉහළම වැටුප් තලයේ පැවතීමට හිමිකම් ලබන අතර, අදාළ වැටුපෙන් 15% ක්වූ සංඝනා දීමනාවකට සහ තනතුරට අදාළ වෙනත් දීමනා ලැබීමට හිමිකම් ලබයි.

පත්වීම සඳහා වූ ක්‍රියා පටිපාටිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 02/2020 හා 2020.05.04 දින දරණ කොමිෂන් සභා චක්‍රලේඛයේ නිර්ණායකයන්ට අනුකූල වන අතර එම චක්‍රලේඛය https://www.ugc.ac.lk/index.php?option=com_content&view=article&id=2198%3Acommission-circular-no-022020-appoinment-to-the-post-of-vice-chancellor&catid=176%3Acirculars-published-in-2020-012020-and-above&Itemid=20&lang=en යන වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැක.

අපේක්ෂකයා ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 63ට අඩු විය යුතුය. පහත සඳහන් ලියකියවිලි අයදුම්පත්/ නාමයෝජනා සමඟ ඉදිරිපත් කළ යුතු වේ.

(i) උපන් දිනය ඇතුළුව අයදුම්කරුගේ/ නාමිකයාගේ සම්පූර්ණ කරන ලද ජීව දත්ත.
(ii) විශ්වවිද්‍යාලයේ සංවර්ධනය පිළිබඳ පෞද්ගලික දැක්ම සහ උපකුලපති තනතුරට පත් වුවහොත් අපේක්ෂකයා විසින් අත්කර ගැනීමට යෝජනා කරන දේ පිළිබඳ කෙටි විස්තරයක්.
(iii) වත්මන් උපකුලපතිවරයා අයදුම්කරුවෙකු වෙනම් හෝ අයදුම්කරුවෙකු මෙයට පෙර විශ්වවිද්‍යාලයක උපකුලපති තනතුර හොබවා තිබේ නම් ඉහත සඳහන් (i) හා (ii) ලියකියවිලිවලට අමතරව ඔහුගේ/අයගේ පළමු ධූර කාලය තුළ අත්පත් කරගන්නා ලද සාධක ඉස්මතු කරමින් වාර්තාවක්.
(iv) නාම යෝජනාවක් නම්, නම් කරනු ලබන තැනැත්තාගේ කැමැත්ත පළ කරන ලිපියක්.
(v) අයදුම්කරු/ නාමිකයා රාජ්‍ය සේවය, සමාගමක, වෘත්තීයාපිත මණ්ඩලයක හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය හැර වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි නියුක්ත වන්නේ නම් අයදුම්කරු/ නාමිකයා මෙම තනතුර සඳහා හෝ රාජකාරි ලැබුවහොත් ඔහු/අය සේවයෙන් නිදහස් කළ හැකි බවට සේවා යෝජකයාගෙන් ලබා ගන්නා ලද ලිපියක්.

ඇගයීම් කමිටුව විසින් සම්මුඛ පරීක්ෂණයක් සඳහා අපේක්ෂකයින් කැඳවනු ලැබේ. විශේෂිත තත්වයක් තුළ, කිසියම් අපේක්ෂකයෙකුට ඇගයීම් කමිටුව ඉදිරියේ පෙනී සිටීමට නොහැකි නම්, ඔහුට/අයට **වීඩියෝ සම්මන්ත්‍රණ** හරහා සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

ඇගයීම් කමිටුව විසින් ලැයිස්තුගත කර ඇති පාලක සභාව විසින් අනුමත කරන ලද අපේක්ෂකයින් අටම වශයෙන් වැනාඩි දහයක (10) කාල සීමාවක් හෝ වැනාඩි පහළොවක් (15) නොඉක්මවන කෙටි ඉදිරිපත් කිරීමක් සඳහා විශේෂ පාලක සභා රැස්වීමට කැඳවනු ලැබේ.

අයදුම්පත්/ නාමයෝජනා **ඩබ්ලිව්.එල්. වන්ධන ජයසේන මිය, ලේඛකාධිකාරී සහ ලේකම්, පාලක සභාව, ලේඛකාධිකාරී කාර්යාලය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ** යන ලිපිනයට 2021 ජනවාරි 11 වන දින ප.ව. 3.00ට පෙර ඉහත කාර්යාලයට ගෙනවිත් භාරදීම හෝ ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට හැකි වන පරිදි එවිය හැකිය. නියමිත දිනට පසු අයදුම්පත් භාරගනු නොලැබේ. අදාළ ලිපිලේඛන ඇතුළු අයදුම්පත්/ නාම යෝජනා අඩංගු කවරයෙහි ඉහළ වම් කොලුවෙහි "උපකුලපති තනතුර" ලෙස සඳහන් කළ යුතුය.

ඩබ්ලිව්.එල්. වන්ධන ජයසේන,
ලේඛකාධිකාරී සහ ලේකම්, පාලක සභාව
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල
නුගේගොඩ
2020 නොවැම්බර් 27 වන දින